# හිඹුටු **(Himbutu)**

Order : Celastrales
Family : Hippo crateaceae
Genus : Salacia L.
Species : *Salacia chinensis* L.

අතීත ජනප්‍රවාද කවි ගී වල ද සඳහන්වන හිඹුටු අප නොහඳුනන තරමට මේ වන විට අවට පරිසරයෙන් ඈත් වී ගොස් ඇත. කිසිසේත්ම වගා කිරීම සඳහා එක් කර නොගත් පලතුරක් ලෙස හිඹුටු සැලකිය හැකිය. හිඹුටු තෙත් කලාපය ආශ්‍රිතව කුඩා වන ලැහැබ් වල හා කඳු ආශ්‍රිතව ස්වාභාවිකව වැවෙනු දැකිය හැකිය. එමෙන්ම මෙම හිඹුටු වැල් ඉන්දියාව හා තායිලන්තය ආදී රටවල බහුලව වැවෙන අතර ඖෂධීය ශාකයක් ලෙස සැලකේ.

හිඹුටු වැලක් ලෙස වර්ධනය වේ. අසල ඇති විශාල ගස් වල එතෙමින් ද නැතහොත් පොළවට සමාන්තරවද අඩි 20-60 ක් පමණ දිගට හිඹුටු වැල් වැඩෙනු දක්නට ඇත. හොඳින් වැඩුනු පරිනත හිඹුටු වැලක කඳක විෂ්කම්භය අඩි 1 ක් පමණ විශාල වැල්ද දක්නට ඇත. පරිනත හිඹුටු වැල් හරි කෙලින් වැඩෙනවාට වඩා දක්නට ලැබෙන්නේ ගස්වල එතෙමින් ඇඹරී වැඩෙන ස්වාභාවයකි











හිඹුටු වැල් වල අතු රිකිලි දිගේ මල් හා ගෙඩි රාශියක් හටගනී. කුඩා මල් කහ පැහැති හෝ කොළ පැහැයට හුරු කහ පැහැති වේ. ඉදෙන හිඹුටු ගෙඩි දැකුම්කළු තැඹිලි පැහැයක් ගනී. හිඹුටු ගෙඩියක ඇතුලත බීජ 03 ක් පමණ දක්නට ලැබෙන අතර ඒ වටා ආහාරයට ගත හැකි තැඹිලි පැහැති ජෙලිමය මාංශලයක් ඇත. ඉතා මිහිරි රස හිඹුටු ස්වාභාවික වනාන්තර වල තිබෙන බවට තොරතුරු ලැබී ඇත. දැනට ගවේශණයන් මගින් සොයාගෙන ඇති විශේෂයන් එතරම් පැණි රස නොවන අතර ඒවායේ බ්‍රික්ස් අගය 5-6 ක් පමණ වේ. හිඹුටු ගෙඩියක් රවුම් හැඩයක් ගන්නා අතර එහි බර ග්‍රෑම් 12-16 ක් පමණ වේ.

හිඹුටු වැල් වල අතු රිකිලි දිගේ මල් හා ගෙඩි රාශියක් හටගනී. කුඩා මල් කහ පැහැති හෝ කොළ පැහැයට හුරු කහ පැහැති වේ. ඉදෙන හිඹුටු ගෙඩි දැකුම්කළු තැඹිලි පැහැයක් ගනී. හිඹුටු ගෙඩියක ඇතුලත බීජ 03 ක් පමණ දක්නට ලැබෙන අතර ඒ වටා ආහාරයට ගත හැකි තැඹිලි පැහැති ජෙලිමය මාංශලයක් ඇත. ඉතා මිහිරි රස හිඹුටු ස්වාභාවික වනාන්තර වල තිබෙන බවට තොරතුරු ලැබී ඇත. දැනට ගවේශණයන් මගින් සොයාගෙන ඇති විශේෂයන් එතරම් පැණි රස නොවන අතර ඒවායේ බ්‍රික්ස් අගය 5-6 ක් පමණ වේ. හිඹුටු ගෙඩියක් රවුම් හැඩයක් ගන්නා අතර එහි බර ග්‍රෑම් 12-16 ක් පමණ වේ.

## ප්‍රචාරන

හිඹුටු ප්‍රචාරණය බොහෝවිට සිදුවන්නේ මුල් පැළ මගින් බව පෙනේ. බීජ මගින් පැළ නිපදවා ගැනීම එතරම් පහසු නොවේ. කෙසේ වුවද හිඹුටු පිළිබඳ විද්‍යාත්මක හා තාක්‍ෂණික තොරතුරු අල්පය

## භාවිත

මෙහි ආහාරමය හා පෝෂණීය වටිනාකමක් ඇති බව සඳහන් වුවද ඒ පිළිබඳව බොහෝ දේ තවදුරටත්අධ්‍යයනය කළ යුතුය. හිඹුටු මුල් දියවැඩියාව රෝගය පාලනය කරන ඖෂධීය නිෂ්පාදන සඳහා භාවිතා කරන බව වාර්තා වේ. තායිලන්තයේ ද හිඹුටු ඖෂධීය කසාය නිෂ්පාදනයට ද උදර ආබාධ සඳහා ද, ඇඟපතේ වේදනාව සමනය කිරීමටද භාවිතා කරන බව සඳහන් වේ. ගෙවත්තට අලංකාරයක් එක් කරන මලින් හා එල වලින් පිරීයන හිඹුටු වැල්, භූමි අලංකරණයේ දී භාවිත කළ හැකිය. එමෙන්ම සීමිත ඉඩකඩක් සඳහා බඳුනක වුව ද සිටුවා ගත හැකිය